## රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්තවාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් පවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරන තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකල නොවීම්

පහත දැක්වෙන ශ ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී.ලං.ගි.ප්‍ර.අංක 05 | එකතුව රු.4,689,642 ක් වටිනා අභාවිත අමුද්‍රව්‍ය හා විකිණිය නොහැකි අභ්‍යාස පොත් තොගයක් නිමි තොගය තුල අන්තර්ගතව තිබූ අතර එම තොගයේ වටිනාකම ප්‍රමිතියට අනුකූලව ගැලපීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී.ලං.ගි.ප්‍ර.අංක 18 | මෙහෙයුම් කටයුතු සඳහා තවදුරටත් භාවිතා වන සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවත් වර්ෂ ගණනාවකට පෙර සම්පූර්ණයෙන් ක්ෂය වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදීද එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

## 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගණම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේදී ඉවතලන කඩදාසි විකිණීමෙන් ලද රු.1,116,903 ක ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ නිරවුල් නොකරන ලද අත්තිකාරම් මුදල වූ රු.1,728,961 ක ලැබිය යුතු අත්තිකාරම් ලෙස නොපෙන්වා ණයහිමියන්ගෙන් අඩුකර පෙන්වා තිබුණි.

## 1.2.3 නොසැසඳූ ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික කඩදාසි සංස්ථාවට අදාලව අයවිය යුතු ණය හා ගෙවිය යුතු ණය ලෙස පිළිවෙලින් රු.5,257,174 ක් හා රු. 4,788,576 ක් ගිණුම් වල දක්වා තිබුණද, ජාතික කඩදාසි සංස්ථාවේ ශේෂ තහවුරු ලිපිය අනුව මුද්‍රණ සංස්ථාවට අයවිය යුතු ණය හා ගෙවිය යුතු ණය පිළිවෙලින් රු.4,673,863 ක් හා රු. 3,566,223 ක් වූ හෙයින් රු.583,311 ක් හා රු. 1,222,353 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

## 1.2.4 ලැබිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ .

( අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී වෙළඳ ණයගැති වටිනාකම රු. 474, 810, 854 ක් වූ අතර එයින් රු.396,176 ක් වූ ණයගැතියන් පමණක් සනාථ කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල ණයගැති ශේෂය සඳහා පමණක් ශේෂ තහවුරු කිරීම් කැඳවා තිබුණු අතර වසර 1කට වැඩි ශේෂ සඳහා කිසිදු ණයගැතියෙකුගෙන් ශේෂ සනාථ කිරීම් කැඳවා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ ණයගැති ශේෂය වූ රු. 474,810,854 න් පිළිවෙලින් රු.76,079,850, රු.57,184,740 හා රු.24,858,601 ක් වර්ෂ 1, 2 හා වර්ෂ 5කට වැඩි ණයගැති ශේෂ විය.

(ඇ) අලෙවිසැල් වල 2010 වර්ෂයේ ණයගැතියන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු ණයමුදලක් අයනොවූ ණයගැතියන් විසිදෙදෙනකු වූ අතර එහි වටිනාකම රු.3,655,380 ක් විය.

(ඈ) 2006, 2007 සහ 2010 යන වර්ෂයන් සඳහා නිකුත් කරන ලද ඉන්වොයිස් 11 ක් වෙනුවෙන් අයකර ගත යුතු රු. 5,314,296 ක මුදලක් 2011 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඉ) 2011 දෙසැම්බර් 31 දිනට නොපිය වූ අත්තිකාරම් රු. 4,813,153 ක් වූ අතර ඉන් රු.1,525,593 ක් වර්ෂ දෙකකට පෙර ලබා දී ඇති අත්තිකාරම් වේ.

### 1.2.5 නීතිරීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම්.

පහත සඳහන් නීතිරීති හා රෙගලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2000 ජනවාරි 21 දිනැති අංක 3/2000 දරන රාජ්‍ය පර්පාලන චක්‍රලේඛයේ 10:1 හා 10:4 ජේද | රු.2,799,538 ක් වැය කර යෙදුණු විදේශ ගමන් සම්බන්ධයෙන් අවශ්‍ය පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2010 ඔක්තෝබර් 11 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙ අංක 01/2010/01 චක්‍රලේඛය | 2011 ජනවාරි 1 සිට ජූලි 31 දක්වා කාලය තුල රු. 2,799,538 ක් වැයකර යෙදුනු විදේශ ගමන් සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් නිරවුල් කොට නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 2 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි | සභාපතිවරයාගේ නවාතැන් ගාස්තු වශයෙන් 2011 වර්ෂයේදී එකතුව රු.614,787ක මුදලක් අවස්ථා 08 කදී පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි .<br><br>අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලබා 2011 වර්ෂය තුලදී සංස්ථාව විසින් රු. 2,500,000 ක් පර්ත්‍යාග වශයෙන් ගෙවා තිබුණ. |

## 1.2.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මහනුවර අලෙවිසලෙහි අලෙවිය සඳහා 2010 නොවැම්බර් මස නිකුත් කර තිබූ වටිනාකම ආසන්න වශයෙන් රු. 3,381,000 ක් වූ පොත් තොගයක් මහනුවර අලෙවිසලට ලැබී නොතිබුණි." මෙම තොගය මධ්‍යම පළාතේ අලෙවි ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් යොදා ගැනීම සඳහා මහනුවර අලෙවි සැලෙහ කාර්යභාර නිලධාරිණිය වෙත යැවුණු තොගයක් බවත් , අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගන්නා බැවින් බින්කාඩ් වලට ඇතුලත් කිරීම අවශ්‍ය නොවන බවත් "සභාපතිවරයා විසින් සඳහන් කර තිබුණි.

(ආ) මහනුවර අලෙවිසලෙහි එකතු වටිනාකම රු.731,367 ක් වූ අත්පිට විකුණුම් ඉන්වොයිස් පිටපත් 32 ක ගණුදෙනුව සිදු කළ දිනය සඳහන් කොට නොතිබුණු බැවින් මුදල් ප්‍රමාදයකින් තොරව බැංකු ගත කළ බව සනාථ කළ නොහැකි විය. එසේ වුවද එම ඉන්වොයිස්වල මුදල් අංශයට ලැබී ඇති පිටපත්වල මුදල් ලැබුණු දිනය සඳහන් කර තිබුණු බවත් බොහෝ අවස්ථාවල ඊට පසු දිනම බැංකුගත කර තිබුණු බවත් සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.133, 688, 336 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා අනුරූපී බදු පූර්ව ශුද්ධ ලාභය රු.92,128,005 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.41,560,331 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හේතු වූ කරුණු වූයේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අවසන් තොග වටිනාකම ප්‍රමාණාත්මකව වර්ධනය වීමත්, ඒ හේතුවෙන් දළලාභයේ ප්‍රමාණාත්මක වර්ධනයක් පෙන්නුම් කිරීමයි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ වැදගත් දත්තයන් ඉකුත් වර්ෂයට අදාල අනුරූප අගයන් සහිතව පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | |
|---|---|---|---|---|
| | 2011 රු.('000) | % | 2010 රු.('000) | % |
| විකුණුම් | 1,199,585 | - | 985,404 | - |
| විකුණුම් පිරිවැය | 792,849 | - | 654,031 | - |
| දළලාභය | 406,736 | 33.9% | 331,373 | 33.6% |
| ආදායම් බදු | 56,688 | - | 40,086 | - |
| ශුද්ධ ලාභය (බදු වලට පසු) | 77,000 | 6.4% | 52,042 | 5.3 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

අලෙවි හා නිෂ්පාදන තොරතුරු ඉකුත් වර්ෂ සමග සසඳා පහත දැක්වේ.

#### 3.1.1 අලෙවි කටයුතු

| අලෙවිය | 2011 රු. ('000) | 2010 රු. ('000) | විචලනය රු.('000) | % |
|---|---|---|---|---|
| පාසල් පොත් | 715,714 | 618,088 | 97,626 | 15.8 |
| වාණිජ මුද්‍රණ | 286,237 | 203,545 | 82,692 | 40.6 |
| අභ්‍යාස පොත් | 166,067 | 141,545 | 24,522 | 17.3 |
| අනෙකුත් | 31,567 | 22,226 | 9,341 | 42.0 |

### 3.1.2 නිෂ්පාදන කටයුතු

| නිෂ්පාදනය | 2011 ඒකක | 2011 රු.('000) | 2010 ඒකක | 2010 රු.('000) | විචලනය ඒකක | විචලනය රු.('000) | % |
|---|---|---|---|---|---|---|---|
| පාසල් පොත් (පිටපත් ('000) | 10816 | 595,021 | 7465 | 535,725 | 3351 | 59,296 | 11.1 |
| වාණිජ මුද්‍රණ (වැඩ සංඛ්‍යාව) | 851 | | 723 | | 128 | | |
| අභ්‍යාස පොත් (පිටපත් ('000) | 8162 | 124,298 | 7251 | 96,483 | 911 | 27,815 | 28.8 |
| අනෙකුත් (පිටපත්) | - | - | 1000 | 1,273 | (1000) | (1,273) | - |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට වයඹ විශේෂ ව්‍යාපෘතියෙන් අයවීමට ඇති රු. මිලියන 3.12 ක් වූ ශේෂය අය කර ගැනීමට සහ නොවිකිණී ඉතිරිව තිබූ පොත් තොග ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. තවද ව්‍යාපෘතිය භාරව කටයුතු කල අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් විසින් සංස්ථාවට භාර නොදුන් රු. 645,245 ක් වූ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුන අතර සංස්ථාවේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නොව එම නිලධාරීන් දෙදෙනා සංස්ථා සෙවයෙන් ඉවත්ව ගොස් තිබුණි.

(ආ) නියමිත දිනට පොත් මුද්‍රණය කර භාර දීමට නොහැකි වීමත්, නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීමත් මත පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම වෙනුවෙන් 2010 වර්ෂය වෙනුවෙන් රු. 25,945,168 ක් හා 2011 වර්ෂය වෙනුවෙන් රු. 28,944,632 ක් වශයෙන් එකතු වටිනාකම රු. 54,889,800 ක් වූ දඩ මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඇ) සංඝරාජ මාවත තොග ගබඩාව සහ සංස්ථාවේ අලෙවිසැල්වල පවතින තොග හා දේපල සම්බන්ධව රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කුලී පදනම මත ලබාගෙන ඇති අලෙවිසල් 5 ක කුලී ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ අභ්‍යාස පොත් අලෙවිය රු.10,000 ට වැඩි වන ඇනවුම් වලදී ගැණුම්කරුට 40% ක වට්ටමක් දෙනු ලබන අතර ඉතිරි 60% සංස්ථාවේ නිෂ්පාදන පිරිවැය සහ ලාභය ආවරණය කරනු ලබයි. මෙමගින් ලාභයෙන් වැඩි ප්‍රමාණයක් බාහිර පාර්ශවයන්ට ගලා යන අතර සංස්ථාවට හිමිවනුයේ ඉතා සුළු ලාභ ප්‍රතිශතයක් පමණි. මේ පිළිබඳව කරුණු දක්වමින් "පෞද්ගලික ආයතනවලට සාපේක්ෂව සංස්ථා නිෂ්පාදන වල මිල ඉහල බවත් වට්ටම් ප්‍රතිශතය වෙනස් කිරීම සිදුකළහොත් එය සංස්ථාවේ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුමට බලවත් පහරක් වන බැවින් ලාභයෙන් ඉහල අනුපාතයක් බාහිර පාර්ශවයන් වෙත ගලායාම නොවැලක් විය හැකි කරුණක් බව" සභාපතිවරයා විසින් සඳහන් කර තිබුණි.

(ඊ) අත්පිට විකුණුම් සඳහා අනුගමනය කරනු ලබන මෙම වට්ටම් ක්‍රමය මධ්‍යම පළාතේ එක් ගැනුම්කරුවකු සඳහා 2010 වර්ෂයේ සිට අනුගමනය කර තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට ඔහුගෙන් අයවිය යුතු ශේෂය රු.2,188,401 ක් වූ අතර මුදල් අයකර ගැනීම අවදානමකට ලක් වූ අවස්ථාවකදී එයට මුහණ දීම සඳහා ආරක්ෂක ඇපකරයක් හෝ ලබාගැනිමට කටයුතු කර නොතිබුණි.

(උ) සෞම්‍යමූර්ති තොණ්ඩමාන් පදනම වෙනුවෙන් පොත් තොගයක් මුද්‍රණය කිරීම සඳහා වටිනාකම රු. 5,397,603 ක් වූ ඇණවුමක් භාර ගෙන රු.1,900,000 කට ආසන්න මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාගෙන තිබුණි. ඇණවුමෙහි කොටසක් වශයෙන් රු.1,440,805 ක වටිනාකමින් යුත් පොත් තොගයක් මුද්‍රණය කොට සපයා තිබූ අතර රු.1,030,875 වටිනා පොත් සහ කවර තොගයක් මුද්‍රණය කර වර්ෂයකට වැඩි කාලයක ගබඩාවේ ගොඩ ගසා තිබුණි.

## 3.3 නිෂ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 5,075,327 ක පමණ වටිනාමකින් යුත් අභ්‍යාස පොත් තොගයක් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වෙමින් ගබඩාව තුළ තිබුණි.

(ආ) නිෂ්පාදිත පොත් අලෙවියකින් තොරව අලෙවිසැල් ගබඩාවල තිබුණු අතර ගම්පහ සහ මහනුවර අලෙවිසැල් වල පමණක් මෙසේ රැඳී තිබුණු තොගයේ වටිනාකම පිළිවෙලින් රු. 827,300 ක් හා රු.520,065 ක් විය.

## 3.4 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 සහ 2011 වර්ෂවලදී ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී සිදු වී ඇති රු. 227,656 ක මුදල් ඌනතාවය අදාල නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු. 544,337 ක් වූ තොග ඌනතාවය එයට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර නොගෙන ඉන් වටිනාකම රු.322,132 ක් පොත් වලින් කපා හැර තිබුණි. ඉතිරි රු.222,205 ක් සමාලෝචිත වර්ෂය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

සංස්ථා සේවකයින් 11 දෙනෙකු ජන මාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයටත්, බස්නාහිර පළාත් සභාවටත් මුදාහැර තිබුණු අතර, වැටුප් වශයෙන් රු. 1,917,670 ක් සහ අතිකාල දීමනා වශයෙන් රු. 238,968 ක් ද වූ එකතුව රු. 2,156,638 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් ගෙවා තිබුණි.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ආයතන කළමනාකරු නමින් තනතුරක් ඇති කොට පුද්ගලයකු බඳවා ගෙන තිබූ අතර, මාසිකව රු.30,000 බැගින් දීමනාවක් සහ රු.40,000 ක මාසික කුලී පදනම මත වාහනයක්ද ලබා දී තිබුණි. තවද පෞද්ගලික සහකාර නමින් තනතුරක් සඳහාද පුද්ගලයකු බඳවා ගෙන මාසිකව රු.20,000 බැගින් දීමනාවක් ගෙවා තිබුණි. ගොඩනැගිලි නඩත්තුව සහ පාර්සරික සංවර්ධන කටයුතු සැලකිල්ලට ගෙන මෙම තනතුර ස්ථාපිත කළ බවත් , අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවත් සභාපතිවරයා වීසින් දන්වා තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනැති අංක 26/2010 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙ විධිවිධාන වලට පටහැනිව සේවකයන් 106 දෙනෙකු බඳවා ගෙන 2011 වර්ෂය සඳහා රු.19,565,586 ක් වැටුප් වශයෙන් ගෙවා තිබූණි. "විධිමත් අනුමැතියක් සහිත කාර්ය මණ්ඩල බඳවා ගන්නා තෙක් අත්‍යවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා පමණක් අවම මට්ටමෙන් කොන්ත්‍රාත් අනියම් හා දෛනික වැටුප ගෙවීමේ පදනම මත බඳවා ගත් බවත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අදාල අනුමැතිය ලබා ගැනීමෙන් පසු විධිමත්ව බඳවා ගැනීම් සිදු කරනු ලබන බවත්" සභාපතිවරයා දන්වා තිබුණි.

(ඇ) සංස්ථාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී වසර 04 ක කාලයක් ගත වී තිබුණද එම තනතුර පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) මහනුවර අලෙවිසලේ අධි සේවක උපයෝජනයක් නිරීක්ෂණය වූ අතර කොන්තාත් පදනම මත 08 ක් සහ අනියම් පදනම මත 03 ක් වශයෙන් සෙවකයන් 11 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. අලෙවි ආදායම, තොගය පිළිබඳ වගකීම සහ අලෙවිසැලේ සියලුම කටයතු සම්බන්ධ වගකීම අනියම් පදනම මත බඳවා ගත් ස්ථාන භාර නිළධාරිණිය වෙත පවරා තිබුණි.

## 3.7 වාහන උපයෝජනය

සංචිත වාහන 18 ක් නිළධාරීන් සඳහා වෙන්කරන ලද වාහන 05 ක් අමාත්‍යාංශයට අනුයුක්ත කල වාහන 02 ක් වශයෙන් වාහන 27 ක් සංස්ථාව සතුව තිබුණි. නියැදි පරීක්ෂණයකදී අනාවරණය වූ පරිදි නිලධාරීන් සඳහා වෙන්කරන ලද වාහන 2 ක් සම්බන්ධයෙන් රු. 211,944 ක් වටිනා ඉන්ධන විධිවිධාන වලට පටහැනිව භාවිතා කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

## 4.1 සංයුක්ත සැලැස්ම

සංස්ථාවේ 2009-2013 කාලපරිච්ජේදය සඳහා සංයුක්ත සැලැස්මක් සකස කර තිබුණද, අංක පීඊඩී/12 හා 2003 ජුනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ජේදය ප්‍රකාරව එම සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර නොතිබුණි.

## 4.2 ක්‍රියාකාරී සැලැස්ම

සංයුක්ත සැලැස්මේ සමාලෝචිත වර්ෂයට අදාල සියළු ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිලියෙළ කළ යුතු වුවත්, සංස්ථාව ඉලක්ක ගත නිෂ්පාදන ප්‍රමාණයන් හා වටිනාකම් පමණක් දක්වමින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීමේ හැකියාව හීන වී තිබුණි.

## 4.3 ප්‍රසම්පාදන සැලැස්ම

සංස්ථාවේ ප්‍රසම්පාදන සැලැස්ම පිලියෙල කර අනුමත කර තිබුණේ 2011 මැයි 26 දිනදීය.

## 4.4 අයවැය ලේඛණමය පාලනය

අයවැය ගත හා තථ්‍ය ශේෂ අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛණය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති පාලන දුර්වලතා

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ලැබිය යුතු ගිණුම්
(ඇ) අත්තිකාරම් නිරවුල් කිරීම
(ඈ) අයවැය පාලනය
(ඉ) මුදල් පාලනය
(ඊ) තොග පාලනය
(උ) අභ්‍යන්තර විගණනය